

# සිනමාහල නිවසට රැගෙන ආ ප්ලාස්මා රූපවාහිනී

**ඔබගේ නිවසේ ඇති රූපවාහිනිය පින්තූරයක් සේ බිත්තියේ එල්ලා තැබීමට කැමති ද? එසේම සිනමාහලකට ගොස් සිනමා පටයක් නැරඹීමේදී ඇතිවන තෘප්තිය නිවසේදීම ලබා ගැනීමට කැමති ද? එසේනම් එයට ඇති එකම විසඳුම ප්ලාස්මා (Plasma) රූපවාහිනියයි.**

මොකක් ද මේ ප්ලාස්මා රූපවාහිනී කියන්නේ? ඊට පෙර දැනට ඔබ නිවසේ ඇති රූපවාහිනිය දෙස නෙත් යොමු කරන්න. ඉදිරිපස තිරයක් ඇති ප්ලාස්ටික් ආවරණයකින් හා පිටුපස බැලූවිට පිටතට නෙරාගිය හැඩයකින් යුත් බරින් වැඩි වඩා ඉඩකඩක් අවශ්‍යවන උපකරණයකි. තිරයේ ප්‍රමාණය විශාලවත්ම මෙම නෙරාගිය කොටසද තරමක් විශාලත්වයක් ගනී. එමෙන්ම තිරයේ ප්‍රමාණය විශාලවීමේදී එහි දර්ශනය වන රූපවල පැහැදිලිතාවය ද යම් ප්‍රමාණයකින් අඩු වේ. අඟල් 29 හා ඊට විශාල රූපවාහිනීවල මෙම දූර්වලතාව හොඳින් දිස් වේ. එමෙන්ම මෙවැනි විශාල තිර සහිත රූපවාහිනී නැරඹීම සඳහා සෑහෙන පිටුසට වී සිටිය යුතු වේ.

මෙම දූර්වලතා මගහැරවීම සඳහා හඳුන්වා දුන්නේ, ප්‍රොජෙක්ෂන්(Projection T.V) රූපවාහිනියයි. මෙම රූපවාහිනී මගින් කලින් සඳහන් කළ දෝෂයන්ට යම් තරමකින් හෝ පිළියමක් ලැබුණි. මෙහි ටියුබය වෙනුවට වෙනත් තාක්ෂණයක් උපයෝගී කරගන්නා නිසා පිටුපස සඳහා වැයවන්නේ ඉතා අඩු ඉඩ ප්‍රමාණයකි. එමෙන්ම තිරය විශාල වීමේදී ඇතිවන දෝෂයන්ට ද යම් තරමකින් හෝ පිළියම් යොදා ඇති නිසා වැඩි අපහසුවකින් තොරව නැරඹිය හැකියි.

මෙම ප්‍රොජෙක්ෂන් රූපවාහිනී වැඩි වශයෙන් නිපදවා ඇත්තේ අඟල් 40 හා ඊට වැඩි පුළුල් තිර යොදගෙන නිසා මෙවැනි රූපවාහිනියකට ඔබ විශාල මුදලක් වැය කළ යුතු වේ. මේ කරුණු නිසා පරිගණක තිර සඳහා යොදා ගන්නාLCD තිර දෙසට නිෂ්පාදකයින්ගේ ඇස යොමු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් LCD තිර සහිත රූපවාහිනී එළි දැක්විය. පැහැදිලි රූපද, තිරය විශාල වීමේදී ඇතිවන අපැහැදිලිවීම් ද




සම්පූර්ණයෙන් ම ඉවත් වූ නිසා මෙවැනි LCD රූපවාහිනී ලොව පුරා ශීඝ්‍රයෙන් ජනප්‍රියත්වයට පත්විය. නමුත් මෙහිදී ද රූපවාහිනියේ පිටුපසට යම් ඉඩක් වැය විය.

මෙසේ මෙම LCD රූපවාහිනී ජනප්‍රියත්වයට පත් වෙනවාත් සමගම අප මුලින් සඳහන් කළ අපූරු ප්ලාස්මා රූපවාහිනිය ;හරට වැඩීය. පිටුපස සඳහා කෙසේවත් ඉඩක් වැය නොවීම, අති විශාල පුළුල් තිර සඳහා ද අතිශය දැකුම්කළු දසුන් මැවීමට ඇති හැකියාව සුපිරි නාද රටා තාක්ෂණයෙන් උපයෝගී කර ගැනීම, උපරිම විභේදනයක් ලබා ගැනීමට ඇති හැකියාව මෙන්ම නවත් බොහෝ විශේෂාංගයන් නිසා LCD රූපවාහිනියේ ජනප්‍රියතාව ශීඝ්‍රයෙන් අඩුවී ප්ලාස්මා රූපවාහිනිය එතැන අරක් ගත්තා ය.

මෙම රූපවාහිනීවල ඇති විශේෂත්වය වන්නේ එහි ඇති සිහින් භාවයයි. එය කොතරම් සිහින්ද යත් කිවහොත් අඟල් 50 පමණ වන රූපවාහිනියක ගැඹුර වන්නේ අඟල් 3.3 ක් පමණයි. මේ නිසා මෙවැනි රූපවාහිනී බිත්ති සැරසිල්ලක් මෙන් බිත්තියේ එල්ලා තැබිය හැකියි. එමෙන් ම තිරය කොතරම් විශාල වුවත් එහි දර්ශනවල කිසිදු අපහැදිලිතාවක් දක්නට ලැබෙන්නේ නැහැ. දැන් අඟල් 83 දක්වා විශාල තිර සහිත ප්ලාස්මා රූපවාහිනී ද වෙළඳපොළට හඳුන්වා දී අවසන්.

එමෙන්ම අඟල් 50 ක තිරයක් සහිත රූපවාහිනී අඩි 10 ක පමණ ළඟ සිට නැරඹීමේදී පවා ඇසට කිසිදු අපහසුවක් දැනේනේ නැහැ.

මෙහි ඇති නවත් සුවිශේෂතාවයක් වන්නේ අධි බලැති ස්පීකර භාවිතා කිරීමට ඇති හැකියාවයි. එම නිසා සෑම ප්ලාස්මා රූපවාහිනීවලට අධි බලැති ස්පිකර් සවි කිරීමට නිෂ්පාදකයන් උනන්දු වී ඇත.

මෙවැනි අති විශාල පුළුල් තිර සහිත ප්ලාස්මා රූපවාහිනී දැන් මෙරට වෙළඳපොළේ ද දැක ගත හැකියි. නමුත් තවමත් මෙහි මිල නම් ඉතා ඉහළ අගයක් ගනියි.

අඟල් 60 පමණ වන රූපවාහිනියක මිල රුපියල් ලක්ෂ දෙළහක් පමණ වේ. නමුත් ශීඝ්‍රයෙන් මෙවැනි රූපවාහිනීවල මිල අඩුවන නිසා ඔබේ නිවසේදීත් මෙවැනි රූපවාහිනී දැක ගත හැකි දිනය වැඩි ඈතක නොවේ. ■

**මොහාන්**

